**House for Sale**
Athurugiriya
**Rs. 880,0000 ONO**

**Property Features**
HOT WATER
MAINLINE WATER
Furnish (optional)
24 HOUR SECURITY
PRIVATE GARDEN
SERVANT'S ROOM

Architect designed two-storey, house on 7 perches at Millennium City Athurugiriya, located in a very private and exclusive in front of the park. Highly residential and secure environment. 3 BR, 2 Toilets, Hall/Dining, Car Porch and Maid's quarters.
Well maintained
- 24 hours centralized security
- All windows and door with Iron protective grills and doors
- Hot & cold water
- Pipe borne water
- Small separate kitchenette
- Tiling through the house
- High ceiling
- Air conditioned TV Lobby and Bedrooms
- Dining area in an elevated leve
- Fitted Kitchen with cocker
- Fully furnished (optional)
- Front courtyard




**Contact - Pradeep 0422069482**



පිළිවෙලක් නැති මේසය පිළිවෙලක් නැති මනසක් පෙන්වනවා කියලා මිනිස්සු කියනවා. එහෙමනම්, කිසිම දෙයක් නැති මේසය පෙන්වන්නේ කුමක්ද මම ඔවුන්ගෙන් අහනවා. - ඇල්බර්ට් අයින්ස්ටයින්

## ජීවිතේ වටිනාකම්

"මට මතක ඇති කාලෙක ඉඳලා අපේ ගෙදර වෙසක් කූඩු හදන්නේත් එල්ලන්නෙත් තාත්තා. වෙසක් දවසට පන්සල් යන්නේ නැති උනත් තාත්තා මේ වෙසක් කූඩු හදන එක නම් නොවැරදීම කරනවා.

වෙසක් කූඩු එක්ක මගේ තියෙන්නේ මිහිරි මතකයක්. පුංචි කාලේ තාත්තා වෙසක් කූඩු හදනවා මල්ලියි මමයි බලාගෙන හිටිය. චිත්‍ර ගුරුවරයෙක් හින්ද පොඩි කාලේ තාත්තා හදපු වෙසක් කූඩු හරි කලාත්මකයි. ටික ටික ලොකු වෙනකොට අපි තාත්ත ළඟ ඉඳගෙන අත් උදව් දෙන්න පටන් ගත්ත.



වෙසක් දවසට කූඩු එල්ලලා, විදුලි පහන් ඔක්කොම නිවලා, වෙසක් හඳේ එළිය මැද්දේ දුබල ඉටිපන්දම් පහනෙන් දිදුලන වෙසක් කූඩුවල සුන්දරත්වය විඳින්න අපට කියල දුන්නේ තාත්තා.

ටික ටික අපි ලොකු උනා. වෙසක් කූඩුත් නවීකරණය උනා. අපිට වැඩ වැඩි උනා. මල්ලිත් ලංකාවෙන් ගියා. අපි ඉන්නේ වෙන වෙන ලෝකවල තනිවෙලා. ඒත් අපෙ තාත්ත නම් තාම අර විදිහට ම වෙසක් කූඩු හදනවා.

අද වෙන වෙන වැඩවල ඉඳලා එළියට බහිනකොට තාත්තා මේ වෙසක් කූඩු තුන හදලා එල්ලලා, තනියම ඒ දිහා බලාගෙන ඉන්නවා.

දැන් අර ඉස්සර වගේ වැඩ දාන්නේ නැහැ. සරල වෙසක් කූඩු තුනක්. ඒ වුනාට මට ඒවා හරිම සුන්දර විදිහට පෙනුනා.

මට ආයෙත් අපේ පුංචි කාලේ මතක් උනා. හැතැප්ම

ගානකට එහා ඉන්න මල්ලිටත් මේ හැඟීම ම දැනෙනවද කියල හිතනකොට හීනි දුකක් එක්ක ලොකු හුදෙකලාවක් හිතේ දල්වුනා. .

ජීවිතේ සුන්දර කරන්නේ පුංචි පුංචි දේවල්වලින්. හැබැයි ඒ දේවල් අමතක උනාම මග ඇරෙන්නේ හුඟක් ලොකු දේවල් කියල මට හිතුනා."

***ඒ සටහන ලිව්වෙ ලේඛිකා කත්‍යානා අමරසිංහ සොයුරිය. කියවද්දි මගේ ඇහැටත් කඳුලක් එක්ක කරන්නට ඒ කතාව සමත්වුණ නිසයි කතා බහට අරගෙන ආවෙ.***

# කතාබහ
ජගත් පේ එදිරිසිංහ

## වෙසක් ඇවිත්



සිංහල අවුරුද්ද වගේම වෙසක් උත්සවයත් වැඩියෙන්ම විඳින්නෙ පොඩි අය කියලයි ම හිතෙන්නෙ. වෙසක් කිට්ටුවෙද්දි අපි ඒ කාලෙ මුලින්ම කළේ බට ගස් හොයගෙන යන එක. කපාගන්න නැත්නම් ඒ කාලෙට පාරවල් අයිනෙ ගොඩ ගහගෙන විකුණන තැනකින් හරි බටගස් ගේනවා. කෑලි කපාලා කූඩු බඳිනවා. රබර් වතු තිබුණ පළාත්වල නම් කූඩු බැන්දෙ ඔට්ටපාලු වලින්.

එක් එක් අයගෙ හැකියා මත කූඩුවෙ ස්වභාවයත් වෙනස් වෙනවා. අටපට්ටම් තරු එළිය පෙට්ටි. තව කොයි තරම් හැඩ වලට කූඩු හැදුවද? පැටව් කූඩු හදලා ගේ ඉස්සරහ ගහක එල්ලන්න උදව් වෙන්නෙ වැඩිහිටියන්. විදුලි බල්බ නොතිබුණ යුගයේ අපි ඒව ආලෝකමත් කළේ ඉටිපන්දම් ගහලා. එහෙමත් නැත්නම් පොල් තෙල් පහන් තියලා.

මේ කූඩු හදන ව්‍යාපෘතියම හරිම සුන්දරයි. ඒ සුන්දරත්වය තාම තියෙනවද?

පහුගියදාක කඩේට ගියාම මෙන්න රෙඩි මේඩ් කූඩු සාදන කට්ටල විකුණන්න තියෙනවා. ප්ලාස්ටික් වලි හදපු රාමු. ඒව එකින් එක අමුණන්න තවත් පුංචි ඇමිනුම් කෑලි. රාමු ටික ඇමිණුම් කෑලි වලින් අමුණලා කූඩුව හදන්න විනාඩි දෙකක් වත් යන්නෙ නැහැ. හරිම ලේසියි. ඒත් අර අපි පුංචි කාලෙ ඕවිටි ගානෙ ඇවිදිමින් බට ගස් හොයාගෙන සුද්ද කරලා කපලා මුලු බැඳලා කූඩුවක් හදද්දි දැනුණ සතුට අද මේ නව තාක්ෂණයේ කූඩු හැදිල්ලෙන් ලැබෙනවද මන්දා.

## එහෙත් එහෙමයි



නේපාලයේ මහා භූමිකම්පාව ගැන දැන් නොදන්න කෙනෙක් නැහැනෙ. දැන් ලෝකයේ හුඟක් රටවලින් නේපාලයට ආධාර දෙන්න පටන් අරන්. මා එක්ක වැඩ කරන නේපාල ජාතික යුවතියක් ඒ ගැන කිව්වෙ මෙහෙම කතාවක්.

"අපේ රටේ ඉන්න දේශපාලකයන් හරිම දූෂිතයි. මේ යවන සල්ලි වලින් වැඩි කොටසක් දාගන්නෙ ඒ අයගෙ ගිණුම වලට. සල්ලි අවශ්‍ය අසරණයන්ට ලැබෙන්නෙ බොහොම ටිකයි"

මට මතක් වුණේ ලංකාවෙ සුනාමි කාලෙ වෙච්ච් දේවල්. සුනාමියට ලෝකයේ රටවලින් ලැබුණ සල්ලි තම තමන්ගෙ විවිධ ගිණුම් වලට දාගත් දේශපාලකයන් ගෙ කතා කොයි තරම්ද? සමහරුන්ට විරුද්ධව නඩුත් වැටුණානෙ. මට පුදුම එහෙම දූෂිත දේශපාලකයන් පස්සෙ දුවන මිනිස්සු ගැනයි

ලෝකෙ හැමතෙනම දේශපාලකයො කියන්නෙ මහම මහ එපාකරපු ජාතියක්.

## භක්ති ගීත



මට මතක හැටියට යුරෝක් දහම් නිකේතනයෙ භක්ති ගී ගායනය ආරම්භ වුණේ මෙයිට අවුරුදු දහයකටත් කලින්. එදා ආනන්ද වන්නිනායක සොහායුරාගෙ සංගීතයට භක්ති ගීත කිව්වේ හත් අට දෙනෙකුගෙ පුංචි කණ්ඩායමක්. එදා භක්ති ගී ගයන්න නියම වෙලා හිටිය මම ස්ව කැමැත්තෙන්ම ඒක මෙහෙයවන කාරියට යොමුවුණා.

එයින් පසුව අපේ හිතවත් විජිත අමරසේකර සංගීතඥයා විසින් මේ වැඩේට උර දුන් පසුව මේ ව්‍යාපෘතිය තවත් දියුණු වුණා. අද වන විට තිහක පමණ සහෝදර සහෝදරියන් පිරිසක් විජිත ආනන්ද හා මනෝ යන සොයුරන් තිදෙනා විසින් පසයනු සංගීතයට භක්ති ගී ගායනා කරනු දැකින්නට ලැබීම සතුටට කරුණක්. මේ කණ්ඩායමේ ගායනාත් දැන් ඉතා විශිෂ්ටයි. අවුරුදු දහයටකට වැඩි කාලයක් මාත් හැම වෙසක් දවසකටම යුරෝක් දහම් නිකේනයේ භක්ති ගී වැඩ සටහන ඉදිරිපත් කිරීමේ කාර්යයේ නිරතව ඉන්නවා. සතුටුයි.

## සහෝදර ප්‍රේමය



නේපාලයේ භූමි කම්පාවෙන් පසු නිකුත් වුණ හද කම්පා කරන සේයා රූ අතර තිබූ මේ සේයාරුව ලොව පුරා සහසකගෙ ඇස් කඳුළින් තෙත් කළා. භූමි කම්පාවෙන් තැති ගෙන සිටින වයස අවුරුදු දෙකහමාරක පුංචි නැගණිය තුරුල් කරගෙන ආරක්ෂා කරගෙන සිටින මේ අයියා ලෝකයේ ඉන්න සියලුම අයියලා සංකේතවත් කරනවා කියලා මට හිතෙනවා.

සැබෑ සහෝදරයන් කියන්නෙ එහෙම අයට තමයි.